# පොළොන්නරු යුගයේ සිතුවම්වල පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික වැදගත්කම

ඒ. එම්. ප්‍රසාදි අප්සරා අදිකාරම්*

සිතුවම් කලාවේ ආරම්භය මානවයාගේ ආරම්භය තෙක් දිවයයි. ශ්‍රී ලංකාවේ චිත්‍ර ශිල්පය ආදිම කාලයේ පටන් පැවත එන බව සාහිත්‍ය මූලාශ්‍රවලින් මෙන්ම නොයෙක් ප්‍රදේශයන්හි පවත්නා පුරාණ චිත්‍ර කර්මයන්ගෙන් ද ප්‍රත්‍යක්ෂ වේ. පොළොන්නරු යුගයේ සිතුවම් පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික වටිනාකමින් යුතු ද යන්න මෙහි අධ්‍යයන ගැටලුවයි. මෙම යුගයේ ඓතිහාසික වටිනාකමක් ඇති ජාතක කතා සහ බුද්ධ චරිතය වස්තු විෂය කරගත් සිතුවම් රාශියක් නිර්මාණය වී ඇත. මහියංගන චෛත්‍යයේ ධාතු ගර්භය, පුල්ලිගොඩ, දිඹුලාගල මාරවීදිය, ගල් විහාරය, තිවංක පිළිමගෙය, ලංකාතිලක පිළිමගෙය යනාදී ස්ථාන වල පොළොන්නරු යුගයේ සිතුවම් දක්නට ලැබේ. මෙම සිතුවම්වල සුවිශේෂී ලක්ෂණ කිහිපයකි. රූප සංරචනය කුසලතාවය එකිනෙකට ගැළපෙන පරිදි අවශ්‍ය කාරණය කැටිකොට දැක්වීම, මානව රූප ඇඳීමේ දී භාවිත කළ රේඛා ලාලිත්‍යය, ශිල්පීය අභිමානය පෙරටු කරගත් භාවමය රූප විලාශය, මානව රූප ඇඳීමේ දී ස්වභාවික ඉරියව් ගෙන හැර පෑමට ගත් උත්සාහය,  සියුම් රේඛාකරණය, නිසි වර්ණ සංයෝජනය යනාදිය මෙම සිතුවම්වල සුවිශේෂ ලක්ෂණ වේ. සිතුවම්වල වේගවත් බව, රිද්මයානුකූල බව දැකිය හැකිය. අවශ්‍ය තැන් වලදී සිහින්ව හා ඝණකම්ව යොදා ඇත්තේ පර්යාවලෝකය, දේහ විද්‍යාව, ප්‍රාමාණිකත්වය පිළිබඳ කුසලතා සම්භාරයකින් හෙබි කලාකරුවන් විසින් විය යුතුය. මෙම සිතුවම් වලට හින්දු ආභාෂය ලබා ඇති බව දේව රූප ආශ්‍රයෙන් සිතිය හැකිය. මෙම සිතුවම් තුළින් එකල ඓතිහාසික තත්ත්වය, සමාජය, භාවිත කළ වස්තූන් පිළිබඳව ද යම්තාක් දුරට අවබෝධ කරගත හැකිය. එකල රාජ්‍ය පාලකයන්ගෙන් පවා මෙම සිතුවම් කලාවට අනුග්‍රහ ලැබී ඇත. පුරාවිද්‍යාත්මක අතින් වටිනාකමක් ඇති මෙම සිතුවම් අතීත උරුමයන් හෙළිකරන බැවින් ඓතිහාසික වටිනාකමක් ද ලබා දෙයි. මෙම යුගයේ බදාම ආලේපිත ගල් තලයක් මත මෙන්ම ගඩොල් තලයක් මත බදාම යොදා ටෙම්පරා සහ ප්‍රෙස්කෝ ක්‍රමයට ඇඳි සිතුවම් ද දැනට පුරාවිද්‍යාඥයන් සොයාගෙන ඇත. සිතුවම් සඳහා ස්වභාවික ද්‍රව්‍ය භාවිත කර මැනවින් වර්ණ ගලපා ඇත. පොළොන්නරු යුගයේ සමාජය ලොවට හෙළි කරන සිතුවම් බොහෝමයක් විනාශ වී සුළු ප්‍රමාණයක් ඉතිරිව ඇත. ද්‍රවිඩ ආක්‍රමණ වැනි හේතු නිසා බෞද්ධ සිතුවම් සහිත ගොඩනැගිලි රාශියක් විනාශ වී ගොස් ඇත. පාරිසරික, ස්වභාවික හේතු සහ මානව ක්‍රියාකාරකම් නිසා මෙම සිතුවම් විනාශ වෙමින් පවතී.  පොළොන්නරු යුගය වනවිට ඉතා දියුණු සිතුවම් කලාවක් පැවතියා යැයි සිතීමට තරම් පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික සාධක ඉදිරිපත් වී ඇති නිසා ඒ දෙඅංශයේ වටිනාකම් නිරූපණය කිරීම මෙහි අරමුණ වේ.

ප්‍රමුඛ පද :- ඓතිහාසික,  ද්‍රවිඩ ආක්‍රමණ,  පුරාවිද්‍යාඥයන්,  විනාශ වීම,  මානව ක්‍රියා

* පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය apsaraprasadi89@gmail.com